*සැ. යු.* -2014.11.21 වැනි දින පළ වූ අංක 1890 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,891 - 2014 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2014.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1034 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1035 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1036 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 457

D/960/KDU.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරි 2012 සැප්තැම්බර් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/58762 කෙඩෙට් නිලධාරි දොන් කළිඳු සේකරගේ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-858

---

2014 අංක 458

MOD/DEF/2/01/ENL/02/LCDT

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරි 2014.06.21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ.

සී/59198 කාන්තා කෙඩෙට් නිලධාරි රත්නායක මුදියන්සේලාගේ අනුපමා කුමාරි රත්නායක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-945

2014 අංක 459

MOD/DEF/07/01/AVF/RET/437.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරි 2014 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය අනුමත කර ඇත.

ලුතිනන් පොල්ගම්පොල මුදියන්සේලාගේ සේනානායක බංඩාර, ගරෙ (නි/7742)

ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11-944

---

2014 අංක 460

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට පෙර දක්වා ඇති නිලයන් යටතේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරියට පත් කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම ඉදිරියෙන් දක්වා ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කර ඇත.

ෆලයිට් ලෙෆ්ටිනන් දළදාවත්තගේ අර්චන සමීර විමලගුණ දළදාවත්ත (03363) ගු.තො.නි - 2013.01.11
ෆලයිට් ලෙෆ්ටිනන් ඇඹිල්ල වත්තේ ගෙදර නිලූකා විලාෂිනී (03364) ගු.තො.නි - 2013.01.11
ෆලයිට් ලෙෆ්ටිනන් විදාන ආරච්චිගේ ප්‍රසාද් තරංග විදාන ආරච්චි (03365) ගු.තො.නි. - 2013.01.11
ෆලයිට් ලෙෆ්ටිනන් නාවුල්ලගේ ගයාන් රුවන් කුමාර නාවුල්ලගේ (03370) පාලන පශු - 2013.01.18
ෆලයිං ඔෆිසර් සිරිබද්දන කන්කානම්ගේ චින්තක රුවන් කුමාර (03366) ගු.තො.නි - 2013.01.11
ෆලයිං ඔෆිසර් ප්‍රවීන් දීමන්ත පෙරේරා ජයවර්ධන (03367) ගු.තො.නි. - 2013.01.11

ෆලයිං ඔෆිසර් බණ්ඩාරනායක මුදියන්සේලාගේ ලක්ෂමන් සුගත් බණ්ඩාරනායක (03368) ගු.තො.නි. 2013.01.11

ෆලයිං ඔෆිසර් හාතියල්දෙණියේ රත්නායක මුදියන්සේලාගේ තුසිත රත්නායක (03369) ගු.තො.නි. 2013.01.11

ෆලයිං ඔෆිසර් ලැබුනා පේදුරු සුරේෂ් රසුනාත් (03371) සැපයුම් 2013.01.18

ෆලයිං ඔෆිසර් යොහාන් රනිල් දූලංජ වික්ටෝරියා (03372) සැපයුම් 2013.01.18

ෆලයිං ඔෆිසර් ජයමාන්න මොහොට්ටිගේ දොන් මනීෂ නෙයොමාල් දුෂ්මන්ත ජයමාන්න (03373) සැපයුම් 2013.01.18

ෆලයිං ඔෆිසර් ගවේෂ් නිමන්ත පෙත්තාවඩු (03374) සැපයුම් 2013.01.18

ෆලයිං ඔෆිසර් ලොකුහිටිගේ විමුක්ති මධුරංග ලොකුහිටිගේ (03375) වෛද්‍යය 2013.01.18

පයිලට් ඔෆිසර් කුකුලේ කංකානම්ගේ සමිත ඉන්දුල ආරියතිලක (03376) කාර්මික/ඉංජී 2013.01.18

පයිලට් ඔෆිසර් රාජපක්ෂ මොහොට්ටි මුදියන්සේලාගේ චතුරංග බණ්ඩාර අලුගොල්ල (03377) කාර්ම/ඉංජී 2013.01.18

පයිලට් ඔෆිසර් අමිත් තිවංක අමරසිංහ (03378) කාර්ම/ඉංජී 2013.01.18

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

11-719

# රජයේ නිවේදන

## ඉඩම් මැනුම් සභාව

### ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

2002 අංක 17 දරන මැනුම් පනතේ 47 (1) (අ) වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරන ලද සහ 47 (1) (ඇ) වන වගන්තිය යටතේ වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලද මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛනය

| | *ලියාපදිංචි අංකය* | *සම්පූර්ණ නම* | *අත්හිටුවන ලද/අවලංගු කරන ලද කාලය* |
|---|---|---|---|
| I. | 20040849 | සත්තම්බිරල්ලාගේ දොන් ජෝෂප් ගාමිණී දයා අර්සකුලරත්න | 2014.08.14 සිට ලියාපදිංචිය අවලංගු කරන ලදී |
| II. | 19901048 | ජෝසප් රොහාන්ත අජිත් ද ජැකලින් සෙනෙවිරත්න | 2014.10.01 සිට 2014.12.31 දක්වා වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලදී |

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

2014ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

11-835

---

## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 10(3) යන වගන්ති යටතේ සිදු කෙරෙන නිවේදනය

### බලපත්‍රවලින් නිදහස් කිරීම් නිකුත් කිරීම

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 10(2) වගන්තියට අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආයතනවලට විදුලිබලය බෙදාහැරීම සඳහා බලපත්‍රවලින් නිදහස් කිරීම් නිකුත් කරන ලදී.

| *අයදුම්පත්‍ර අංකය* | *ආයතනය* | *වලංගු කාල සීමාව* සිට | දක්වා |
|---|---|---|---|
| EL/EX-D/14/06 | ඔරියන් සිටි ලිමිටඩ් | 2014 සැප්තැම්බර් 26 | 2019 සැප්තැම්බර් 25 |
| EL/EX-D/14/07 | කොළඹ තරුණ බෞද්ධ සංගමය | 2014 සැප්තැම්බර් 26 | 2019 සැප්තැම්බර් 25 |
| EL/EX-D/14/08 | නාගරික සංවර්ධන අධිකාරිය | 2014 සැප්තැම්බර් 26 | 2019 සැප්තැම්බර් 25 |

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

11-815

**2014/2015 මහ කන්න රැස්වීම් වාර්තාව**

කන්දේඇල ව්‍යාපාරය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දේඇල ව්‍යාපාරයේ 2014/2015 මහ කන්නය සඳහා කන්න රැස්වීම 2014.11.03 වැනි දින කැප්පෙටිපොල, කන්දේඇල ව්‍යාපාර ඒකක කාර්යාලයේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | - අනුමත අක්කර ප්‍රමාණය |
| 2. | වගා කරන බෝගය | - වී හා මිශ්‍ර එළවළු |
| 3. | ඇල වේලි ශුද්ධ කර අවසන් කරන දිනය | - 2014.11.15 ට පෙර |
| 4. | පළමු ජල මුරය නිකුත් කිරීම | - 2014.12.01 |
| 5. | වගාවන් සඳහා භූමිය සකස් කිරීම | - 2014.12.10 සිට 2014.12.20 දක්වා |
| 6. | බෝග සිටුවා අවසන් කරන දිනය | - 2015.01.01 |
| 7. | අවසන් ජල මුරය නිකුත් කිරීම | - 2015.04.30 |
| 8. | ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩ මුදල | - පෑල් 1 කට දිනකට වැටුප රු. 800.00 ක් |
| 9. | කන්නය ඇතුළත දෙවන වරට ඇළ වේලි ශුද්ධ කිරීම | - 2015.02.20 |
| 10. | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | - 2015.05.15 |

11. නියමිත දිනට ඇල වේලි ශුද්ධ නොකරන ගොවීන් සඳහා දඩ මුදල් අය කිරීම වාරිමාර්ග ආඥා පනත හා ගොවිජන සේවා පනත අනුව කටයුතු කිරීම.

12. වාරි ඇල පද්ධතියට හානි පමුණුවන, ජලයට අපද්‍රව්‍ය බැහැර කරන සහ ජල මුර ක්‍රමයට අවනත නොවී කටයුතු කරන පුද්ගලයින් සම්බන්ධව නීත්‍යානුකූල පියවර ගැනීම සුදුසු බවට තීරණය විය.

11-723

---

**2014-2015 මහ කන්න රැස්වීම් වාර්තාව**

අඹේවෙල ව්‍යාපාරය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹේවෙල ව්‍යාපාරයේ 2014/2015 මහ කන්නය සඳහා කන්න රැස්වීම 2014.11.03 වැනි දින හෙවණකුඹුර, අඹේවෙල වාරිමාර්ග ඒකක කාර්යාලයේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී.

| | | |
|---|---|---|
| 1. | වගා කරන බිම් ප්‍රමාණය | - අක්කර 940 |
| 2. | වගා කරන බෝගය | - වී සහ මිශ්‍ර එළවළු |
| 3. | ඇල වේලි ශුද්ධකර අවසන් කරන දිනය | - 2014.11.30 |
| 4. | පළමු ජල මුරය නිකුත් කිරීම | - 2014.12.05 |
| 5. | වගාවන් සඳහා භූමිය සකස් කර අවසන් කරන දිනය | - 2014.12.05 |
| 6. | බෝග සිටුවා අවසන් කරන දිනය | - 2014.12.25 |
| 7. | අවසන් ජල මුරය නිකුත් කිරීම | - 2015.04.30 |
| 8. | ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩමුදල | - මීටර් 10 කට දිනක වැටුප රු. 800.00 |
| 9. | කන්නය ඇතුළත දෙවන වරට ඇල වේලි ශුද්ධ කිරීම | - 2015 මාර්තු දෙවන සතිය |
| 10. | අස්වනු නෙලා අවසන් කළ යුතු දිනය | - 2015.05.15 |
| 11. | ජල හිඟයක් ඇති වුවහොත් ජල මුර ක්‍රමය ක්‍රියාත්මක වේ. | |

11-722

---

**නාරාහේන්පිට තැපැල් ගබඩාවේ ලිපි ද්‍රව්‍ය අංශය වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සඳහා වසා තැබීම**

නාරාහේන්පිට තැපැල් ශාඛාවේ ලිපි ද්‍රව්‍ය අංශය 2014 වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සඳහා 2014.12.22 වැනි දින සිට 2015.01.19 වැනි දින දක්වා වසා තබනු ලැබේ.

ලිපි ද්‍රව්‍ය ඉල්ලුම්පත් 2014.12.16 වැනි දිනට පෙර, එකී ගබඩාවට ලැබෙන්නට සලස්වන මෙන් අදාළ සියලුම නිලධාරීන්ට මෙයින් දන්වා සිටිමි.

සහකාර අධිකාරි (සැපයුම්).

අධිකාරි (සැපයුම්) කාර්යාලය,
තැපැල් දෙපාර්තමේන්තුව,
නාරාහේන්පිට,
කොළඹ 05.

11-933

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - සංස්ථා බැංකු කටයුතු (කෝපරේට් බෑන්කින්)**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0864-013081-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.07.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් සහතික කරන ලද සියලු හයම 2008 මාර්තු 14 දිනැති අංක 1443, 1444, 1446, 1448, 1465, 1469 සහ දෙකම 2009 අප්‍රේල් 27 දිනැති අංක 1627 සහ 1628 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 06 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීවී 3229 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන (කලින් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 17908 දරන) කලින් ඕස්ට්‍රේලියන්

කෝප්පරේට් ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් හඳුන්වනු ලද ඕස්ට්‍රේලියන් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ප්‍රොපටි ඩෙවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි අසූහයලක්ෂ අනූඅටදහස් හත්සිය අනූඅටයි ශත හැත්තෑහතක (රු.28,698.798.77) මුදලක්, 2011 දෙසැම්බර් 21 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 28,698,798.77 මුදලද 2012 ජනවාරි 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යොදුණු වෙනත් ගාස්තුද තදන 1443, 1444, 1446, 1448, 1465, 1469, 1627 සහ 1628 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි, දෙවැනි, තුන්වැනි, හතරවැනි, පස්වැනි, හයවැනි, හත්වැනි සහ අටවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්ඕ/යූ1.

නිදන කාමර 3 කින්, සාලයකින්, කෑම කාමරයකින්, කුස්සියකින්, බැල්කනියකින් සහ නාන කාමර 3 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක 734 1/8 දරන බිම් මහල ට මායිම් : උතුරට සීඊ ඒ 20, සීඊ ඒ 15 සහ සීඊ ඒ 14 ද, නැගෙනහිරට : සීඊ ඒ14, සීඊ ඒ 17 සහ සීඊ ඒ21, බද්ධ නිවාස කොටස ඒ/එෆ්ඕ/යූ8 සහ සීඊ ඒ 20 ද, දකුණට : සීඊ ඒ 20 ද, බස්නාහිරට සීඊ ඒ 20 සහ උපාංග කොටස ඒ/එෆ්ඕ/යූ1/ඒ1 ද, මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/ඒෆ්1/යූ1 යට අහස් මුදුනින් : සීඊ ඒ 6 ද, වන වර්ග මීටර් 92 ක් ඇති බිම් ප්‍රමාණය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/03 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්ඕ/යූ1 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංකඃ ඒ/එෆ්ඕ/යූ1/ඒ 1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්ගේ නොබෙදූ කොටස් අගය වන 1.50% සමග.

### දෙවැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්ඕ/යූ 2.

නිදන කාමර 02 කින්, සාලයකින්, කෑම කාමරයකින්, කුස්සියකින්, බැල්කනියකින් සහ නාන කාමර 2 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර, වරිපනම් අංක 734 1/1 දරන බිම් මහල ට මායිම් : උතුරට : බද්ධ නිවාස කොටස් ඒ/එෆ්ඕ/යූ3, සීඊ බී 15, සීඊ බී 14 සහ සීඊ ඒ 14, සීඊඒ5 ද, නැගෙනහිරට : සීඊඒ5, සීඊඒ3 සහ සීඊ ඒ20, දකුණට : සීඊ ඒ 16, සීඊ ඒ 20 සහ උපාංග කොටස ඒ/එෆ්ඕ/යූ2/ඒ1 ද, බස්නාහිරට : සීඊ ඒ 20 සහ බද්ධ නිවාස කොටස ඒ/ එෆ්ඕ/යූ2/ඒ1ද/මුදුනින්ඃ බද්ධ නිවාස කොටස ඒ/එෆ්1/යූ2, යට අහස් මුදුනින් : සීඊ ඒ 16, සිඊ ඒ 8 ද වර්ග මීටර් 70 ක් ඇති බිම් ප්‍රමාණය, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/05 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්ඕ/යූ2 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංක ඒ/එෆ්ඕ/යූ2/ඒ 1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්ගේ නොබදූ කොටස් අගය වන 1.50% සමග

### තුන්වැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්ඕ/යූ7.

නිදන කාමර 03 කින්, සාලයකින්, කෑම කාමරයකින්, කුස්සියකින්, බැල්කනියකින් සහ නාන කාමර 03 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක : 734 1/6 දරන බිම් මහලට මායිම්, උතුරට : සීඊ බී 13, පාර සහ සීඊ ඒ 20 ද, නැගෙනහිරට : සීඊඒ 20, උපාංග කොටස ඒ/එෆ්ඕ/යූ7/ඒ1සහ ඒ/එෆ්ඕ/යූ8, /ඒ1 සහ බද්ධ නිවාස කොටස ඒ/එෆ්ඕ/යූ8 ද, දකුණට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්ඕ/යූ8, සීඊ. ඒ13 සීඊ ඒ18 සහ සීඊ ඒ 14 ද, බස්නාහිරට : සීඊ බී 14, සීඊ ඒ14, සීඊ බී 13, මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්1/යූ7, යට අහස් මුදුනින් : සීඊ ඒ 7 සහ සීඊ ඒ 12ද වන වර්ග මීටර් 100 ක් ඇති බිම් ප්‍රමාණය : මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/15 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්ඕ/යූ7 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංකඃ ඒ/එෆ්ඕ/යූ7/ඒ1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්ගේ නෙබෙදූ කොටස් අගය වන 1.50% සමග.

### හතරවැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්1/යූ2.

නිදන කාමර 2 කින්, සාලය, කෑම කාමරය, කුස්සිය, බැල්කනිය සහ නාන කාමර 2 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර, වරිපනම් අංක 734 2/1 දරන පළමුවෙනි මහල ට මායිම් : උතුරට : බද්ධ නිවාස කොටස සීඊ ඒ20, සීඊබී 15 සහ සීඊ ඒ14ඒ සීඊ ඒ 5 ද, නැගෙනහිරට : සීඊ ඒ 5, සීඊ ඒ 3 සහ සීඊ ඒ 20 ද, දකුණට : සීඊ ඒ 16, සීඊඒ 20 සහ උපාංග කොටස ඒ/එෆ්1/යූ2/ඒ1 ද බස්නාහිරට : උපාංග ඒ/එෆ්1/යූ2/ඒ1 සීඊ ඒ 20 සහ බද්ධ නිවාස කොටස ඒ/එෆ්1/යූ3, මුදුනින් / බද්ධ නිවාස කොටස ඒ/එෆ්2/යූ2 යට අහස් මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්ඕ/යූ 2 ද වන වර්ග මීටර් 70 ක් ඇති බිම් ප්‍රමාණය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්ජී/01/21 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්1/යූ2 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංකඃ ඒ/එෆ්1/යූ2/ඒ1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්ගේ නොබෙදූ කොටස් අගය වන 1.50% සමග.

### පස්වැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්5/යූ7.

නිදන කාමර 3 ක්, සාලය, කෑම කාමරය, කුස්සිය, බැල්කනිය සහ නාන කාමර 3 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක 734 6/6 දරන පස්වෙනි මහල ට මායිම් : උතුරට :සීඊ බී13, සීඊ ඒ 20 ද, නැගෙනහිරට : සීඊඒ20, ඒ/එෆ් 5/යූ7/ඒ1, ඒ/එෆ්5/යූ8/ඒ1, ඒ/ඒෆ්5/යූ8 ද, දකුණට : ඒ/එෆ් 5/යූ 8, සීඊ ඒ13, සීඊඒ 18, සීඊ ඒ14ඊ ද, බස්නාහිරට : සිඊ බී 14එඊ, සීඊ ඒ14ඊ, සීඊ බී13 ද, මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්6/යූ 7, යට අහස් මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්4/යූ 7 ද වන වර්ග මීටර් 100 ක් ඇති බිම් ප්‍රමාණය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/95 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්5/යූ 7 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංක ඒ/එෆ්5/යූ 7/ඒ 1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන්ගේ නොබෙදූ කොටස් අගය වන 1.50% සමග.

### හයවැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්6/යූ7.

නිදන කාමර 3 ක්, සාලය, කෑම කාමරය, කුස්සිය, බැල්කනිය සහ නාන කාමර 3 කින් සමන්විත කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක 734 7/6 දරන හයවෙනි මහල ට මායිම් : උතුරට :සීඊ බී13, පාර, සීඊ ඒ 20

ද, නැගෙනහිරට : සීර්ඒ20, ඒ/එෆ් 6/යූ7/ඒ1, ඒ/එෆ්6/යූ8/ඒ1/ඒ/ඒෆ්6/යූ8 ද, දකුණට : ඒ/එෆ් 6/යූ 8, සීර් ඒ13, සීර්ජ් 18, සීර් ඒ14එෆ් ද, බස්නාහිරට : සීර් බී 14 එෆ්, සීර් ඒ14 එෆ්, සීර් බී 13 ද, මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්7/යූ 7, යට අහස් මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්5/යූ 7 ද වන වර්ග මීටර් 100 ක් ඇති බිම් ප්‍රමාණය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/III යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඒ/එෆ්6/යූ 7 බද්ධ නිවාස කොටස සඳහා උපාංග කොටස් අංක : ඒ/එෆ්6/යූ 7/ඒ 1 දරන බැල්කනියට අයිතිවන සභාධිපත්‍ය දේපලෙහි පොදු අංගයන්ගේ නොබෙදූ කොටස් අගය වන 1.50% සමග

### හත්වැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්7/යූ 7

කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක 734 8/6 දරන හත්වෙනි මහලේ බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්7/යූ7

(ඒ) නිදන කාමර 3 ක්, සාලය, කෑම කාමරය, කුස්සිය බැල්කනිය සහ නාන කාමර 3 කින් සමන්විත වේ.

(බී) මායිම් : උතුරට : සීර් බී 13, පාර සහ සීර් ඒ 20 ද, නැගෙනහිරට : සීර් ඒ 20, උපාංග කොටස ඒ/එෆ්7/යූ7/ඒ1 සහ ඒ/එෆ්7/යූ8/ඒ1 සහ බද්ධ නිවාස කොටස ඒ/එෆ්7/යූ8 ද, දකුණට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්7/යූ8, සීර් ඒ 13, සීර් ඒ 18 සහ සීර් ඒ 14 පී ද, බස්නාහිරට : සීර්බී 14පී, සීර්ඒ14 පී, සීර්බී 13ද, මුදුනින් : සීර් ඒ25, සීර් ඒ 26, සීර් ඒ 29, සීර් ඒ 33, සීර් ඒ 34, සීර් ඒ 36ඒ, සීර් ඒ36බී, සහ සීර් ඒ 40 ද, යට අහස් මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්6/යූ7 ද වන වර්ග මීටර් 100 ක් ඇති බිම් ප්‍රමාණය

(සී) උපාංග කොටස අංක : ඒ/එෆ්7/යූ7/ඒ1(අංක : ඒ/එෆ්7/යූ7 කොටසට අයිති බැල්කනිය) ට මායිම් : උතුරට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්7/යූ8, නැගෙනහිරට : සීර්ඒ 20 ද, දකුණට : සීර්ඒ20, උපාංග කොටස ඒ/එෆ්7/යූ8/ඒ1 සහ බද්ධ නිවාස කොටස, ඒ/එෆ්7/යූ8, ඒ/එෆ්7/යූ7ද, බස්නාහිරට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්7/යූ7ද, මුදුනින් : සීර් ඒ 40 ද, යට අහස් මුදුනින් : උපාංග කොටස ඒ/එෆ්6/යූ7/ඒ ද, වන වර්ග මීටර් 5 ක බිම් ප්‍රමාණය.

මෙම ඒ/එෆ්7/යූ7 බද්ධ නිවාස කොටස සඳහා සභාධිපත්‍ය දේපලෙහි පොදු අංගන්ගේ නොබෙදූ කොටස් අගය 1.63% වේ.

කඩිනම් පොදු ප්‍රවේශය සඳහා ප්‍රවේශය : සීර් ඒ 14පී, සීර් ඒ 3 (තරප්පු පෙළ) සීර් ඒ 5 (විදුලි සෝපානය හරහා ප්‍රවේශය.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/117 යටතේ ලියාපදිංචි කර ඇත.

### අටවැනි උපලේඛනය

බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්3/යූ 8

කොළඹ 06 හැව්ලොක් පාර වරිපනම් අංක : 734 4/7 දරන තුන්වෙනි මහලේ බද්ධ නිවාස කොටස් අංක : ඒ/එෆ්3/යූ8

(ඒ) නිදන කාමර 3 ක්, සාලය, කෑම කාමරය, බැල්කනිය සහ නාන කාමර 3 කින් සමන්විත වේ.

(බී) මායිම් : උතුරට : සීර් බී 13, සීර් ඒ19, බද්ධ නිවාස කොටස ඒ/එෆ්3/යූ7 සහ උපාංග කොටස ඒ/එෆ්3/යූ7/ඒ1ඒ, එෆ්3/යූ8/ඒ1 ද, නැගෙනහිරට : සීර් ඒ 20, උපාංග කොටස ඒ/එෆ්3/යූ8/ඒ1 ද, දකුණට : සීර් ඒ 20 ද, බස්නාහිරට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්3/යූ1, සීර් ඒ21, සීර් ඒ 17, සීර්ඒ14 සී සහ සීර් ඒ 13ද, මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්4/යූ 8 ද, යට අහස් මුදුනින් : බද්ධ නිවාස කොටස ඒ/එෆ්2/යූ8 ද වන වර්ග මීටර් 198 ක් ඇති බිම් ප්‍රමාණය

(සී) උපාංග කොටස අංක : ඒ/එෆ්3/යූ 8/ ඒ1 (කොටස් අංක : ඒ/එෆ් 3/යූ 8 ට අයිති බැල්කනිය) ට මායිම් : උතුරට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්3/යූ 8/ඒ/ඒෆ්3/යූ7, උපාංග කොටස ඒ/එෆ්3/යූ7/ඒ1 සහ සීර් ඒ 20 ද, නැගෙනහිරට : සීර් ඒ 20 ද, දකුණට : සීර් ඒ 20 සහ බද්ධ නිවාස කොටස ඒ/එෆ්3/යූ 8 ද, බස්නාහිරට : බද්ධ නිවාස කොටස ඒ/එෆ්3/යූ 8 ද, මුදුනින් : උපාංග කොටස ඒ/එෆ් 4/යූ8/ඒ1, යට අහස් මුදුනින්, උපාංග කොටස ඒ/එෆ් 2/යූ8/ඒ1 ද වන වර්ග මීටර් 5 ක බිම් ප්‍රමාණය

මෙම ඒ/එෆ්3/යූ 8 බද්ධ නිවාස කොටස සඳහා සභාධිපත්‍ය දේපලෙහි පොදු අංගයන්ගේ නොබෙදූ කොටස් අගය 1.60% වේ.

කඩිනම් පොදු ප්‍රදේශය සඳහා ප්‍රවේශය : සීර් ඒ 14 පී, සීර් ඒ 3 (තරප්පු පෙළ), සීර්ඒ5 (විදුලි සෝපානය හරහා ප්‍රවේශය.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්/එස්/එස්පී/01/117 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිණී - නීති.

11-783

පීවී 20903.

---

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "ඊ-ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.07.05 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඊ-ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඊ-ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
*(රාජකාරි ඉටුකිරීම).*

2014 නොවැම්බර් මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-862

පීවී 20951.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "යුනිලක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.09.23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "යුනිලක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "යුනිලක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2014 නොවැම්බර් මස 08 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-863

---

පීවී 17450.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඉක්රා ඉන්ටනැෂනල් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1991.12.18 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඉක්රා ඉන්ටනැෂනල් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඉක්රා ඉන්ටනැෂනල් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2014 නොවැම්බර් මස 08 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-864

---

පීවී 76202.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ආර්ක් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2010.12.23 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ආර්ක් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ආර්ක් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2014 නොවැම්බර් මස 08 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-865

---

පීවී 21742.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඩෙටා ස්කේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2004.02.27 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඩෙටා ස්කේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඩෙටා ස්කේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2014 නොවැම්බර් මස 08 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

11-866

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මාතලේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : රබිත ලක්ෂාන් අතුරුසිංහ සහ අතුරුසිංහ රාජමන්ත්‍රිලාගේ සරත් ආනන්ද
පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.10.24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, රබිත ලක්ෂාන් අතුරුසිංහ සහ අතුරුසිංහ රාජමන්ත්‍රිලාගේ සරත් ආනන්ද විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කෝලිත එස්. බණ්ඩාර විජේරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.07.19 දිනැති අංක 3000 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 3000 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2014.09.22 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හත් මිලියන නවසිය අසූ නව දහස් තුන්සිය හැත්තෑ අටයි ශත පනස් පහ (රු. 79,89,378.55)ක මුදල සහ 2014.09.23 වැනි දින සිට රුපියල් හත් මිලියන අටසිය එකොලොස් දහස් එකසිය විසිපහයි ශත හැත්තෑ දෙක (රු. 78,11,125.72)ක මුදල් සීමාව දක්වා වාර්ෂිකව 20% බැගින් පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 3000 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හත් මිලියන නවසිය අසූ නව දහස් තුන්සිය හැත්තෑ අටයි ශත පනස් පහ (රු. 79,89,378.55) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3(50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, කොහොන්සිය පත්තුවේ දොඩන්දෙනියෙහි පිහිටා ඇති "බංගලාවකුඹුර (හුලංගමුව එස්ටේට්)" න්, බලයලත් මානක කේ. ඕ. පෙරේරා විසින් සකසන ලද අංක 2265 සහ 2002.01.07 දිනැති පිඹුරෙහි ලොට් 2 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කරන ලද ඉඩම වන උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : නිවාසවල සිට කන්දේගෙදර - මාතලේ පාර දක්වා වූ පාර ද (ප්‍රා. ස.), දකුණට : වරිපනම් අංක 65/1 දරන (කන්දේගෙදර පාර) හුලංගමුව එස්ටේට්හි කොටසක් වෙන් කරන කම්බි සහ පැලඉනි වැට සහ බස්නාහිරට : රජය විසින් හිමිකම් කියන කන්දේගෙදර ජනපදය වෙන් කරන කම්බි සහ පැලඉනි වැට ද, මායිම් වූ, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දෙක (අ. 01, රූ. 02, පර්. 2.0) ක් වූ ඉඩම සහ ඒ මත වූ සියලු දේත් සමග එම පිඹුරේ දක්වා ඇති පාරවල් භාවිතා කිරීමේ අයිතිය ද සමග වන අතර මෙය මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පත්ඉරු බී 658/28හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගු,
කළමණාකරු - අය කරගැනීම්.

11-851

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මොහොමඩ් ෆවුසුඩීන් මුෆ්ලිහ්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014ක් වූ ඔක්තෝබර් මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, මොහොමඩ් ෆවුසුඩීන් මුෆ්ලිහ් විසින් බන්ධනදායී ලෙස ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. (මෙහි මින්මතුවට "බැංකුව '' යනුවෙන් හඳුන්වනු ලබන) නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් සහතික කරන ලද වර්ෂ 2012 ක් වූ මාර්තු මස 22 වැනි දිනැති අංක 2324 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 2324 දරන උකස්කරය මත වර්ෂ 2014 ක් වූ අගෝස්තු මස 31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් දාහතර මිලියන හත් ලක්ෂ අසූ දෙදහස් දෙසීය විසි හයයි ශත විස්ස (රු. 14,782,226.20) ක මුදලක් ද, වර්ෂ 2014ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් දාහතර මිලියන හත් ලක්ෂ අසූ දෙදහස් දෙසීය විසි හයයි ශත විස්ස (රු. 14,782,226.20) ක මුදල මත 24% ක වාර්ෂික පොලිය ද, ඉහත කී බන්ධනදායිගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

ඉහත කී රුපියල් දාහතර මිලියන හත් ලක්ෂ අසූ දෙදහස් දෙසීය විසි හයයි ශත විස්ස (රු. 14,782,226.20) ක මුදලක් ද, ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134හි පදිංචි බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිඹිරිගස්යාය ග්‍රාම නිලධාරි වසම තුළ, දෙමටගොඩ කොට්ඨාස අංක 29හි දෙමටගොඩ ශ්‍රී මහින්දාරාම මාවතේ (කලින් පර්ත් පාර යනුවෙන් හඳුන්වනු ලැබූ) පිහිටි, වරිපනම් අංක 39 දරන ඉඩම හෙවත් බලයලත් මිනින්දෝරු ඒ. කේ. නඩරාජා විසින් මැන සාදන ලද වර්ෂ 2005ක් වූ ඔක්තෝබර් මස 28 දිනැති අංක 4685 දරන පිඹුරට අනුව ලොට් අංක 4A දරන කැබැල්ල (මෙය බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹෙවෙල විසින් මැන සාදන ලද 1988.01.18 දිනැති අංක 333B දරන පිඹුරේ ලොට් 04 දරන කැබැල්ලට කරන ලද නැවත මැනුමක් වේ). එකී අංක 4685 දරන පිඹුරට අනුව ලොට් 4A දරන කැබැල්ල, උතුරට : 1988 ජනවාරි මස 18 වැනි දිනැති අංක 333B දරන පිඹුරේ ලොට් 02 දරන කැබැල්ල ද, නැගෙනහිරට : ශ්‍රී මහින්දාරාම මාවතේ වරිපනම් අංක 41 දරන පරිශ්‍රය ද, දකුණට : ශ්‍රී මහින්දාරාම මාවත ද, බස්නාහිරට : පාරක් සඳහා වෙන් කරන ලද කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 12.5)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් ය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1104/237 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මිනින්දෝරු ටී. ජේ. අරඹෙවෙල විසින් මැන සාදන ලද 1988 ක් වූ ජනවාරි මස 18 දිනැති අංක 333B දරන පිඹුරට අනුව ලොට් අංක 5 (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) දරන කැබැල්ල මතින් දිවෙන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉරාන්ත් රොද්‍රිගු,
කළමණාකරු - අයකර ගැනීම්.

11-849

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - රිකිල්ලගස්කඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රාජනායක මුදියන්සේලාගේ කෝරළේ ගෙදර ලලිත් කුමාර රාජනායක.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2014 අප්‍රේල් 30 දී සහතික කළ අංක 3595 සහ 2014 ජූනි 06 දින සහතික කළ අංක 3650 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජනායක මුදියන්සේලාගේ කෝරළේ ගෙදර ලලිත් කුමාර රාජනායක යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි තිස්එක්ලක්ෂ පනස්හත්දහස් එකසිය එකොළහයි ශත විසිනමය (රු. 1,31,57,111.29) ක මුදලක් 2014 ජූලි 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,31,57,111.29 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 අගෝස්තු 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3595 සහ 3650 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩහේවාහැට, කොහොකා කෝරළේ, හඟුරන්කෙත ප්‍රාදේශීය සභා සීමාව තුළ රිකිල්ලගස්කඩ 492ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රිකිල්ලගස්කඩ දෙනිකේ සහ උඩමකුරුප්පේ හි පිහිටි ටොන්ටොන් එස්ටේට් හි බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 1992 සැප්තැම්බර් මස 28 වැනි දින මැන සාදන ලද අංක 3051 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන, උතුරට : වත්තට පිවිසෙන පාරෙන් ද, උතුරු-නැගෙනහිරට : මෙහි ලොට් 2න් ද සහ දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටසෙන් වටවූ ඉඩමට මායිම් වූ රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වන මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ආර් 258/266 යටතේ ලියාපදිංචි කර ඇත.

මෑතකදී කරන ලද මිනුමකට අනුව ඉහත සඳහන් ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩහේවාහැට, කොහොකා කෝරළේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභා සීමාව තුළ රිකිල්ලගස්කඩ 492ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රිකිල්ලගස්කඩ දෙනිකේ සහ උඩමකුරුප්පේ හි පිහිටි ටොන්ටොන් එස්ටේට් හි බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් 2011 ජනවාරි 26 දින මැන සාදන ලද අංක 20/2011 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන, උතුරට : නිවාසවලට පිවිසෙන පාරෙන් ද, නැගෙනහිරට : ටී. බී. අත්තනායක විසින් අංක 3051 දරන පිඹුරේ ලොට් 2හි ටොන්ටන් එස්ටේට් ද සහ දකුණට : අයි. කේ. අබේරත්න සහ අනිකුත් අය හිමිකම් කියන ටොන්ටොන් එස්ටේට් නමැති ඉඩමෙන් ද සහ බස්නාහිරට : පී, කේ. රාජනායක හිමිකම් කියන ඉඩමෙන්, ටොන්ටොන් එස්ටේට් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් තිස්හයයි දශම හය (අ. 0, රූ. 0, පර්. 36.6) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩහේවාහැට කොහොකා, කෝරළේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභා සීමාව තුළ රිකිල්ලගස්කඩ 492ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රිකිල්ලගස්කඩ දෙනිකේ සහ උඩමකුරුප්පේ හි පිහිටි ටොන්ටොන් එස්ටේට් හි බෙදූ කොටස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. පියදාස විසින් 1999 මාර්තු මස 07 වැනි දින මැන සාදන ලද අංක 142/3/99 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන, උතුරට : රිකිල්ලගස්කඩ ප්‍රධාන පාරෙන් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් අංක 7394ඒ දරන පිඹුරේ ලොට් 1 සහ කාණුවෙන් ද, දකුණට : බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් අංක 7394ඒ දරන පිඹුරේ ලොට් 2න් ද, සහ බස්නාහිරට : කාණුවෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් නමය (අ. 0, රූ. 1, පර්. 9) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත්

සමග වන මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු ආර් 333/117 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-929

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගලහා ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වැවිට විදානලාගේ මාධව කීර්ති සුරන්ජිත් වැවිට නොහොත් මාධව කීර්ති සුරන්ජිත් වැවිට.

2014 ඔක්තෝබර් මස 30 පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2013 ඔක්තෝබර් 11 දින සහතික කළ අංක 3340 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වැවිට විදානලාගේ මාධව කීර්ති සුරන්ජිත් වැවිට නොහොත් මාධව කීර්ති සුරන්ජිත් වැවිට යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූඅටලක්ෂ හතලිස්පන්දහස් අටසිය හැටදෙකයි ශත අනූව (රු. 98,45,862.90) ක මුදලක් 2014 අගෝස්තු 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 98,45,862.90 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 සැප්තැම්බර් 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3340 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කෑගල්ල නගර සභා සීමාව තුළ රන්වල ග්‍රාම නිලධාරි වසම් අංක 51 තුළ රන්වල ගමේ පිහිටි වරිපනම් අංක 617 දරන මොරගහමුලහේන සහ පානවත්තහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. කුරුකුලසූරිය විසින් 1997 අප්‍රේල් 18 වැනි දින මැන සාදන ලද අංක පී 2635 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : පාරක් සඳහා ලකුණු කරන ලද අංක පී 2635 දරන පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට : පාරක් සඳහා ලකුණු කරන ලද අංක පී 2635 දරන පිඹුරේ ලොට් 5 සහ ලොට් 4 ද, දකුණට : තැන්නේපිටහේන ද සහ බස්නාහිරට : කොළඹ - මහනුවර ප්‍රධාන පාරෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් හයක (අ. 0. රූ. 1, පර්. 6) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමඟ වන මෙය කෑගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 626/217 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු සී. කුරුකුලසූරිය විසින් 1997 අප්‍රේල් මස 18 වැනි දින සාදන ලද පිඹුරු අංක පී 2635 හි ලොට් 5 වශයෙන් දැක්වෙන බිම් කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-930

---

### මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.10.25 වැනි දින පැවති තම රැස්වීමේ දී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වන වගන්තිය යටතේ පහත සඳහන් පරිදි යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි අංක PV9485 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇති සහ මොරටුව, ෆ්‍රෙයිසර් මාවත, අංක 16 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි කාර්යාලය සහිත සමාගමක් වන සීමාසහිත බාරා එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා විසින් ලියා සහතික කළ 2007 සැප්තැම්බර් මස 05 වැනි දිනැති අංක 1220 දරන උකස් බැඳුම්කරය සහ 2008 මාර්තු 12 දිනැති අංක 1336 දරන උකස් බැඳුම්කරය මත ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. නාරංගොඩ විසින් ලියා සහතික කළ 2006 මැයි මස 03 වැනි දිනැති අංක 1088 දරන උකස් බැඳුම්කරය මත ද, සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඩී. ද එස්. සිරිසේන විසින් ලියා සහතික කළ 2009 නොවැම්බර් මස 19 වැනි දිනැති අංක 406 දරන උකස් බැඳුම්කරය මත ද අයවීමට ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ශ්‍රී ලංකා රුපියල් විසිපන් මිලියන දෙසීය හැත්තෑඑක් දහස් හයසිය හැත්තෑපහයි ශත තුනක (රු. 25,271,675.03)ක මුදලක් ද, එකී බැඳුම්කර මත වැඩිපුර පොළිය ද සමග දැන් මහජන බැංකුව වෙත අයවීමට හිඟව සහ ලැබිය යුතුව ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1220, 1336, 1088 සහ 406 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උකස් කළ නිශ්වල

දේපළ ශ්‍රී ලංකා රුපියල් විසිපන් මිලියන දෙසීය හැත්තෑඑක්දහස් හයසිය හැත්තෑපහයි ශත තුනක (රු. 25,271,675.03) ක මුදලක් 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා විසි දෙමිලියන හත්සියහතලිස් හයදහස් නවසිය හතයි ශත එකක (රු. 22,746,907.01)ක මුදල මත වාර්ෂිකව සියයට විසිපහ (25%) බැගින් වැඩිපුර පොළිය ද සහ එකී මහජන බැංකු පනතේ 29(L) වගන්තිය යටතේ අය කර ගත හැකි ගාස්තු සහ මුදල් ද සමග ඉන්පසු යම් මුදලක් ගෙවා ඇත්නම් එය අඩු කොට අය කර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර සීමාසහිත ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ දෙහිවල පිහිටි ගාලු පාර, වරිපනම් අංක 180, 182 සහ 184 දරන ඇපෝතිකරිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. ඩී. ගුණදාස විසින් සකස් කළ 1993 ඔක්තෝබර් මස 24 දිනැති අංක 47 දරන පිඹුරේ නිරූපිත ලොට් 3013 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලුදේද සමග එකී අංක 3013 දරන කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 2482 සහ 2747 ද, නැගෙනහිරට : ගාලු පාර ද, දකුණට : ශ්‍රෙගරි පෙදෙස සහ බටහිරට : ලොට් 2481 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 47 දරන පිඹුරට අනුව පර්චස් දහඅටයි හයයි එකක් (අ. 0, රූ. 0, පර්. 18.61) හෝ හෙක්ටෙයාර් 0.0471 ක් විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස වන අතර මෙය දෙහි 98/265 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ පංචිකාවත්ත ඡන්ද කොට්ඨාස අංක 25 පංචිකාවත්ත පාර, වරිපනම් අංක 75, 77, 77A සහ 77/1 දරන ගොඩනැගිලි වගාවන් සහ මතුපිට පිහිටි සියලු දේම සමග මැරැන්නෙගෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. ජී. චන්ද්‍රසේන විසින් සකස් කළ 2001 ජනවාරි 30 දිනැති අංක 2001/110 දරන පිඹුරේ නිරූපිත ලොට් Q වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් "P" ද, නැගෙනහිරට : පංචිකාවත්ත පාර ද, දකුණට : පංචිකාවත්ත පාර, වරිපනම් අංක 71 දරන පරිශ්‍රය ද බටහිරට : මොහිදීන් මස්ජිඩ් පාර, වරිපනම් අංක 08A සහ G74 දරන පරිශ්‍රයන් ද යන මායිම් තුළ පිහිටි අංක 2001/110 දරන එකී පිඹුරට අනුව පර්චස් පහලොවයි දශම අටයි හතක් (අ. 0, රූ. 0, පර්. 15.87) ක් ප්‍රමාණයෙන් යුතු සම්පූර්ණ ඉඩම් කොටස වන අතර මෙය A994/274 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළයේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි කිරිළවැල්කටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සකස් කළ 2002 පෙබරවාරි 16 දිනැති අංක 1885 දරන පිඹුරේ නිරූපිත ලොට් Aවශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලුදේම සමග එකී ලොට් A ඉඩම් කොටසට මායිම් උතුරට : මුණසිංහ ආරච්චිගේ ඇල්බට් විසින් හිමිකම්පාන ඉඩම ද, නැගෙනහිරට : මාදම්පේ සිට නෝනගම දක්වා වූ පාර ද, දකුණට : කොළොන්ගම කොරටුවේවත්ත ද සහ බටහිරට : අබේගුණවර්ධන ගමගේ පීරිස් විසින් හිමිකම්පාන ඉඩම ද යන මායිම් තුළ පිහිටි අංක 1885 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් විසිතුනක් (අ. 0, රූ. 2, පර්. 23) හෝ හෙක්ටයාර් 0.26052ක් විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස වන අතර, මෙය G53/278 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමණාකරු - අයකිරීම්,

2013 අගෝස්තු මස 07 වැනි දින,
මහජන බැංකුව,
ආයතනික බැංකු අංශය,
ANCL ගොඩනැගිල්ල,
කොළඹ 10.

11-904

---

### මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු නතේ 29 "ඇ" වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.10.25 වැනි දින පැවති තම රැස්වීමේ දී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වන වගන්තිය යටතේ පහත සඳහන් පරිදි යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි අංක PV9609 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇති සහ මොරටුව, ෆ්‍රෙයිසර් මාවත, අංක 16 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි කාර්යාලය සහිත සමාගමක් වන සීමාසහිත ජයනන්ද ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා විසින් ලියා සහතික කළ 2009 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 1619 දරන උකස් බැඳුම්කරය මතද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. නාරංගොඩ විසින් ලියා සහතික කළ 2006 මාර්තු මස 28 වැනි දිනැති අංක 1068 දරන උකස් බැඳුම්කරය මත ද, සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඩී. ද එස්. සිරිසේන විසින් ලියා සහතික කළ 2009 නොවැම්බර් මස 19 වැනි දිනැති අංක 405 දරන උකස් බැඳුම්කරය මත ද අයවීමට ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ශ්‍රී ලංකා රුපියල් විසිතුන් මිලියන එකසිය අනූනවදහස් එකසිය දහසයයි ශත අසූවක (රු. 23,199,116.80)ක මුදලක් ද, එකී බැඳුම්කර මත වැඩිපුර පොළිය ද සමග මහජන බැංකුව වෙත අයවීමට හිඟව සහ ලැබිය යුතුව ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1068, 1619 සහ 405 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුව වෙත උකස් කළ නිශ්චල දේපළ ශ්‍රී ලංකා රුපියල් විසිතුන් මිලියන එකසිය අනූනවදහස් එකසිය දහසයයි ශත අසූවක (රු. 23,199,116.80) ක මුදලක් ද, 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ශ්‍රී ලංකා රුපියල් විසිඑක් මිලියන අටසිය විසිදහස් පන්සියතිස්දෙකයි ශත අසූහතරක (රු. 21,820,532.84)ක මුදලක් මත වාර්ෂිකව සියයට විසිපහ (25%) බැගින් වැඩිපුර පොළිය ද සහ එකී මහජන බැංකු පනතේ 29(L) වගන්තිය යටතේ අය කර ගත හැකි ගාස්තු සහ මුදල් ද යම් මුදලක් ගෙවා ඇත්නම් එය අඩු කොට අය කර ගැනීම සඳහා කොළඹ බලයලත්

වෙන්දේසිකාර සීමාසහිත ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ දෙහිවල පිහිටි ගාලු පාර, වරිපනම් අංක 180, 182 සහ 184 දරන ඇපෝතිකරිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. ඩී. ගුණදාස විසින් සකස් කළ 1993 ඔක්තෝබර් මස 24 දිනැති අංක 47 දරන පිඹුරේ නිරූපිත ලොට් 3013 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලුදේද සමග එකී අංක 3013 දරන කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 2482 සහ 2747 ද, නැගෙනහිරට : ගාලු පාර ද, දකුණට : ග්‍රෙගරි පෙදෙස සහ බටහිරට : ලොට් 2481 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 47 දරන පිඹුරට අනුව පර්චස් දහඅටයි හයයි එකක් (අ. 0, රූ. 0, පර්. 18.61) හෝ හෙක්ටෙයාර් 0.0471 ක් විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස වන අතර මෙය දෙහි 98/265 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ පංචිකාවත්ත ඡන්ද කොට්ඨාස අංක 25 පංචිකාවත්ත පාර, වරිපනම් අංක 75, 77, 77A සහ 77/1 දරන ගොඩනැගිලි වගාවන් සහ මතුපිට පිහිටි සියලු දේම සමග මැරැන්නෙගෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. ජී. චන්ද්‍රසේන විසින් සකස් කළ 2001 ජනවාරි 30 දිනැති අංක 2001/110 දරන පිඹුරේ නිරූපිත ලොට් 'Q' වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 'P' ද, නැගෙනහිරට : පංචිකාවත්ත පාර ද, දකුණට : පංචිකාවත්ත පාර, වරිපනම් අංක 71 දරන පරිශ්‍රය ද බටහිරට : මොහිදීන් මස්ජිඩ් පාර, වරිපනම් අංක 08A සහ G74 දරන පරිශ්‍රයන් ද යන මායිම් තුළ පිහිටි අංක 2001/110 දරන එකී පිඹුරට අනුව පර්චස් පහලොවයි දශම බිංදුවයි අටයි හතක් (අ. 0, රූ. 0, පර්. 15.87) ක් ප්‍රමාණයෙන් යුතු සම්පූර්ණ ඉඩම් කොටස වන අතර මෙය A994/274 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළයේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය පල්ලෙගම පිහිටි කිරිළවැල්කටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සකස් කළ 2002 පෙබරවාරි 16 දිනැති අංක 1885 දරන පිඹුරේ නිරූපිත ලොට් 'A' වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලුදේම සමග එකී ලොට් 'A' ඉඩම් කොටසට මායිම් උතුරට : මුණසිංහ ආරච්චිගේ ඇල්බට් විසින් හිමිකම්පාන ඉඩම ද, නැගෙනහිරට : මාදම්පේ සිට නෝනගම දක්වා වූ පාරෙන් ද, දකුණට : කොළොන්ගම කොරටුවේවත්ත ද සහ බටහිරට : අබේගුණවර්ධන ගමගේ පීරිස් විසින් හිමිකම්පාන ඉඩම ද යන මායිම් තුළ පිහිටි අංක 1885 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් විසිතුනක් (අ. 0, රූ. 2, පර්. 23) හෝ හෙක්ටයාර් 0.26052ක් විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස වන අතර, මෙය G53/278 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමණාකරු - අයකිරීම්,

2013 අගෝස්තු මස 07 වැනි දින,
මහජන බැංකුව,
ආයතනික බැංකු අංශය,
ANCL ගොඩනැගිල්ල,
කොළඹ 10.

11-905

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.